# සැණකෙළි

එම්.පි.එස්.එස්.ද සිල්වා

කලණ මිතු දමක හැඩරුව විදහන "ආදරයේ සිමෙන්ති" නව කථාව පාසල් අධ්‍යාපනය පාදක කර ගනිමින් දිගහැරෙන අතර පසුව ඒ මිතුරෝ වාම දේශපාලනය තුළ ජාතික අර්බුදයට මුහුණ දෙති. ඉගැන්වීම හා ඉගෙනුම මත නොව දේශපාලන අරගලය, ජන සංහාර, වාර්ගික අවිශ්වාසය, ආර්ථික විනාසය, අසම්මත ආලය ආදිය සමඟ බැඳුණු මේ යුගයේ වෘත්තාන්තයකි. සැණකෙළි, හදිසි අනතුරු, දේශපාලන චාරිකා, මරණය, අනුස්මරණය, චෝදනා, පාපොච්චාරණ, ඇතුලත් උද්වේගකර අවස්ථා මාලාවකි. එමගින් ගොඩනැගෙන විශ්‍රාන්තිමය රටා මේ තුළ නිරූපිතය. පිටු 216කින් සමන්විත වන මෙම පොතෙහි අඩංගු විශ්‍රාන්ති මෙම විවරණයට ඇතුළත් කොට තිබේ.

පාසලේ පළවෙනි දවස බැවින් මම තීන්ත පැනට අතිරේකව පාකර් තීන්ත කූඩුවද රුගෙන ගියෙමි. මේ සියල්ලටම වඩා සතුට දනවූයේ නිල් කොට කලිසම් සාක්කුවේ තිබුණු සත විසිපහේ කාසියයි............ මනුෂ්‍යාගේ මානසික වැඩීම, පෙර විසූ මනුෂ්‍යයින්ගේ සිතුම් පැතුම්, කාලාතික්‍රමයෙන් දූත් පවතිනි............ ඈත අහසේ මැකී යන කුරුලු රූප වැනි අකුරු පේළි හතර කියවීමට නොහැකි වූ විට නළල රැළි කර............සංසුන් පරිසරයකට ඉතිරි වී තිබුනේ අරලියා ගස් සෙවන අතරින් පෙනෙන ක්‍රිස්තියානි පල්ලිය හා කන්‍යාරාමයත් පමණි. වැටකඩුළු නැති නිසා ඒ පෙදෙසද පාසලට අයිති නැති නිස්කලංක බිමක් සේ දිස්විය...........මට සිතුනේ සීඝ්‍රගාමී දුම්රියක් අප යට කරගෙන යන්නට ගොස් අනූ නමයෙන් බේරුන අයුරකි..........දිළිඳු පවුලක ඉපිද විශාල කැපකිරීම් මධ්‍යයේ මුළු මිහිතලය වෙත වාසනාව ගෙන ආ ලුවී මාගේ ලෝකයේද වීරයෙකු බවට පත් විය.........අපගේ සිහිනය වූයේ ඒ පුටුවේ වාඩිවී ඩෙන්ටල් මිස් ලවා දත් බලවා පිරිසිදු කර ගැනීමයි.........සෙන්ට් සුවඳ පතුරමින් අප පසුකර යන ඇය දෙස අප දැඩි ආශාවෙන් බලා සිටියෙමු.........සෞඛ්‍යය සහ පවිත්‍රතාව මඟින් අප වෙත රැගෙන එන ලද්දේ සොම්නසකි........ස්වස්ථතා අවබෝධය කල් යාමේදී පතින් පමණක් නොව සිතින්ද පිරිසිදුව සිටීමේ වුවමනාවක් බවට පත් වූයේ නිතැතිනි........
ඒ අඹ සෙල්ලම අවසන් වූයේ ඔහු උඩුමහල් තලයේ සිට අඹ ගසක් දිගේ ගබඩා බිමට පැනීමෙනි.......ඒ නිදහස් ජල ප්‍රවාහයට මැදි වූ සිසුවෝ නිම් හිම් නැති ප්‍රීතියකින් ජල ක්‍රීඩා කළහ.......තෙත බරිත වූ සුදු කමිස කලිසම් පාසල පුරා දිස්විය....මට සිතුනේ පාසල් බිම මැද නව ලොවක් දිග හැරී ඇති බවකි ගලා එන ජලය නතර කිරීමට කරාමයක්වත් සිසුන්ගේ හැසිරීම වළක්වාලන තහංචියක්වත් නොවුයෙන් ඒ දිය කෙළිය නිදහසේ සිදුවිය.......එය එපමනටම ප්‍රීතිමත් කටයුත්තක් වී තිබුණි.......
ප්‍රදර්ශනයේ පළමු දින පවත්වන දින කැඩෙට් භටයින්ගේ, බාලදක්ෂයින්ගේ සහ සෞඛ්‍යදාන ව්‍යාපාරයේ ක්‍රියාදරයින්ගේ ආචාර පෙළපාලිය නිසා පාසල් භූමිය හමුදා සේනාංක සහ රතුකුරුස සමාජය සහිත යුදංගනයක ස්භාවය ගත්තේය.......ආචාර පෙළපාලිය අවසන්වීමෙන් පසු දර්ශන පතය සම්පූර්ණයෙන් වෙනස් විය.......සමනළ සමනලියන් රැනක් ක්‍රීඩා පිටිය වසා ගත්තා සේය.......දහස් සංඛ්‍යාත ළමා නාටිකාංගනාවෝ සරඹ සංදර්ශනයක් සඳහා පිටියට අවතීර්ණ වී එය නයනාභිරමණීය කරලියක් බවට පත් කළෝය.......ප්‍රදර්ශනය සහ සැණකෙළිය නිසා අපට ප්‍රීතිමත් කාලයක් උදාවිය ඒකාකාරී පාසල් ජීවිතය වෙනුවට සැණකෙළි බිමක සැරිසැරීමේ වාසනාව අපට ලැබිණි......ක්‍රීඩා පිටියේ පැවැත්වෙක මේ සැණකෙළිය ඉතා විසිතුරු එකකි වාදකයන් තුන් දෙනෙකුගේ බෑන්ඩ් සංගීතය රැගෙන වට කැරකෙන ලී අස්සයින් අසූ අටකින් සමන්විත විශාල මෙරිගෝ රවුම සහ බොරළුගොඩින් ගෙනා කතුරු ඔංචිල්ලාව හැරුණු විට ලොතරැයි ටොම්බෝලා ,මැජික් සංදර්ශන ආදිය මගින් රසවත් කළ කානිවල් මේලාව තුළ සවාරි ගැසීම ප්‍රදර්ශන වෙහෙස මකා ගැනීමේ මගක් විය .........
විසඳුවහොත් හොඳ තෑගිබෝග ලැබෙන ප්‍රහේලිකා හා හරස් පද,කැරකෙන වාසනා චක්‍ර ආදී විනෝද ක්‍රීඩා රැසක්ද සැණකෙළි භූමිය තුළ පැවැත්විණි........දාදු කැට,කණාමුට්ටි,උඩ යට යන බෝල ර්තල විදුම්, සංගීත පුටු ආදිය නිසා සැණකෙළි බිම විනෝද සාගරයක්........මේ අනුව බලන විට ආදරයේ සිමෙන්ති නව කථාව තත්කාලීන විශ්‍රාන්තියෙන් අලංකාර වන ආකාරය චමත්කාරජනකය.

ඉලයප්ආරච්චි එරික් (2004), ආදරයේ සිමෙන්ති, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,675 පී.ද එස්. කුලරත්න මාවත, කොළඹ 10